අධ්‍යාපන හා
පර්යේෂණ පුවත්

# සන්දර්ශන

NEWSLETTER

පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

2019 ජනවාරි - ජූනි
දෙවැනි වෙළුම පළමු කලාපය

**වලදායි සංවාදයක් වෙනුවෙන්**
**ආරාධනා**

## යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු සාර්ථක කර ගැනීමට

## ජාතික අධ්‍යාපන ආයතනයෙන් පර්යේෂණයක්

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු සාර්ථක කර ගනු පිණිස, ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේ දී අධ්‍යාපන අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි පත් කරන ලද විද්වත් මණ්ඩලය විසින් සකස් කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අන්තර්ගත කෙටුම්පත සම්බන්ධයෙන් පර්යේෂණයක් සිදු කිරීමට 2018 දී යොමු විය. පර්යේෂණයේ අරමුණ වූයේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ ව සකස් කරන ලද දළ කෙටුම්පත පිළිබඳ ව අධ්‍යාපනය හා සෘජු ව ම සම්බන්ධ පාර්ශ්වවල ප්‍රතිචාර හඳුනා ගැනීම සහ ඔවුන්ගේ ප්‍රතිචාර ඇසුරින් යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා සබැඳි ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම යි.

දෙවැනි පිටුවට...

### ඇතුළු පිටු අතර

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සාර්ථක කරගැනීමට ජාතික අධ්‍යාපන ආයතනයෙන් පර්යේෂණයක් 2
අනාගත වෘත්තීන්ට ගැළපෙන මානව සම්පත් ගොඩනැගෙන 13 වසරක සහතික අධ්‍යාපන වැඩසටහන 4
වෘත්තීය විෂය ධාරාවේ ප්‍රධාන සංරචක 5
13 වසරක සහතික කළ අධ්‍යාපන වැඩසටහන වෘත්තීය මාර්ගෝපදේශ විෂය 7
නව පාඨමාලා හා පාඨමාලා ද්‍රව්‍යයන් නව සංශෝධන සමඟ ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය දෙපාර්තමේන්තුවෙන් වසරකට විෂය 30ක් 8
අධ්‍යාපන පර්යේෂණ කෙටි පාඨමාලා දෙකක් 9
29 වන ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර අනුස්මරණ දේශනය 10
අධ්‍යාපන පර්යේෂණ සඟරා නිකුත් කෙරේ 11
පසුගිය පුවත් 12



## අධ්‍යාපන දර්ශනපති පාඨමාලාවට (MPhil) අයදුම්පත් කැඳවයි

ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන සංවර්ධනය අරමුණු කොට, 1985 අංක 28 දරන පාර්ලිමේන්තු පනත මගින් පිහිටුවූ ජාතික අධ්‍යාපන ආයතනය, අධ්‍යාපන ක්ෂේත්‍රයේ නොසිඳී මෙහෙවරක යෙදෙමින්, ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය සඳහා වූ ජාතික මට්ටමේ එක ම ශාස්ත්‍රීය ආයතනය ලෙස, ඊට පැවරී ඇති බලතල ප්‍රකාර ව, උපාධි සහ පශ්චාද් උපාධි පිරිනැමීම ප්‍රවිශේෂී කාරණයකි. මෙම කාර්යය ක්‍රියාත්මක කිරීමට පැවරී ඇත්තේ ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත ය. ඒ අනුව පාඨමාලා අටක් දැනට ක්‍රියාත්මක වේ. ඒ අතුරින් එක් පාඨමාලාවක් ලෙස අධ්‍යාපන දර්ශනපති පාඨමාලාව (MPhil), අධ්‍යාපන පද්ධතියේ උන්නතිය වෙනුවෙන් ප්‍රවිශේෂී මෙහෙවරක් ඉටු කරයි.

ජාතික අධ්‍යාපන පද්ධතියේ ප්‍රගමනය සඳහා, ශාස්ත්‍රීය සහ වෘත්තීය දායකත්වය, විශිෂ්ට මට්ටමින් ලබා දිය හැකි බුද්ධිමතුන් බිහි කිරීම ජාතික අවශ්‍යතාවකි. ඒ වෙනුවෙන් සැප විය හැකි, අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිරත ව සිටින ගුරුවරුන්, විදුහල්පතිවරුන්, ගුරු අධ්‍යාපනඥයින් මෙන් ම ශාස්ත්‍රීය කටයුතුවල නියැළෙන වෙනත් වෘත්තිකයින්ට ජීවිතීය පර්යේෂණ කුසලතා වර්ධනය කර ගැනීමටත්, අනාගත අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම වෙනුවෙන් සක්‍රීය දායකත්වයක් ලබා දීමටත් පසුබිම් ප්‍රවේශයක් ලබා දෙමින්, 2007 වසරේ දී, ජාතික අධ්‍යාපන ආයතනයෙහි පශ්චාද් උපාධියක් ලෙස, අධ්‍යාපන දර්ශනපති උපාධි පාඨමාලාව ආරම්භ කරන ලදි.

දෙවැනි පිටුවට...

# නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සාර්ථක කර ගැනීමට
# ජාතික අධ්‍යාපන ආයතනයෙන් පර්යේෂණයක්

## යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ කෙටුම්පත්කරණයේ ආරම්භය

තාක්ෂණික ක්ෂේත්‍රයේ සිදුවන ශීඝ්‍ර පරිවර්තනවලට සමාන්තර ව, ලෝකයේ සෑම රටකට ම, ගෝලීය වශයෙන් මුහුණ දිය යුතු නව අභියෝග රාශියක් වර්තමානයේ දී නිර්මාණය වී ඇත. ඒ අනුව බොහෝ රටවල් එම අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි පරිදි, ඊට අනුගත ව, සිය අධ්‍යාපන පද්ධතිය තුළ අවශ්‍ය සංශෝධන සිදු කරමින්, විසි එක් වැනි සියවසෙන් ඔබ්බට සාකල්‍ය වර්ධනයක් සහිත පුද්ගලයන් බිහි කරලීමේ කාර්යයට අවතීර්ණ ව සිටියි. මේ පදනම මත පිහිටා ශ්‍රී ලංකාව ද සිය අනාගත ඉලක්ක සපුරා ගැනීම සඳහා අධ්‍යාපන පද්ධතියේ සිදු විය යුතු ප්‍රතිසංස්කරණ අරමුණු කර ගනිමින් ප්‍රතිපත්තිමය තීරණවලට එළඹීමත්, අවශ්‍ය විෂයමාලා සංශෝධන කිරීමත් කෙරේ අවධානය යොමු කර ඇත.



ඒ අනුව ගරු අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාමාන්‍ය අධ්‍යාපනයේ සිදු විය යුතු විෂයමාලා ප්‍රතිසංස්කරණ පිළිබඳ ව කෙටුම්පතක් සැකසීම සඳහා අධ්‍යාපනය හා සම්බන්ධ සියලු රාජ්‍ය ආයතන නියෝජනය වන පරිදි 2017 වර්ෂයේ දී කමිටුවක් පත්කරන ලදි. එම කමිටුව ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු සභාව සහ ආයතන සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව, විශ්වවිද්‍යාල පද්ධතිය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, නිපුණතා හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ පාර්ශ්ව නියෝජනය කරන ප්‍රවීණ විද්වතුන්ගෙන් සමන්විත විය. මෙම කමිටුව මගින් ප්‍රතිසංස්කරණ කළ යුතු ක්ෂේත්‍ර හතරක් හඳුනා ගන්නා ලදි.

- 12 හා 13 ශ්‍රේණි සඳහා නව වෘත්තීය විෂයධාරාවක් හඳුන්වා දීම
- අ.පො.ස. (උ. පෙ.) 12 හා 13 ශ්‍රේණි ආශ්‍රිත ප්‍රතිසංස්කරණ
- අ.පො.ස. (සා. පෙ.) 10 හා 11 ශ්‍රේණි ආශ්‍රිත ප්‍රතිසංස්කරණ
- ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

මෙම ක්ෂේත්‍ර පිළිබඳ ව ගැඹුරින් කරුණු සොයා බැලීමටත්, ඒ අනුව නව ප්‍රතිසංස්කරණ යෝජනා කෙටුම්පත් සකස් කිරීම සඳහාත් ක්ෂේත්‍ර හතර සඳහා අනු කමිටු හතරක් පත් කෙරිණ. එම අනු කමිටු විසින්, අදාළ ක්ෂේත්‍ර හතර සම්බන්ධ ව සිදු කළ සාකච්ඡා මාලාවක් අවසානයේ ඉදිරිපත් කළ යෝජනා අනුව, යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ ව දළ කෙටුම්පතක් සංවර්ධනය කරන ලදි. එම කෙටුම්පත, 2017-12-16 වන දින ජාතික අධ්‍යාපන ආයතනයේ නව ශ්‍රවණාගාරයේ දී පවත්වන ලද සම්මේලනයේ දී, සිය දෙනෙකුගෙන් සමන්විත විද්වත් මණ්ඩලයක් වෙත ඉදිරිපත් කර, ශාස්ත්‍රීය වශයෙන් වැදගත් විද්වත් මණ්ඩල කතිකාවතක් ගොඩ නඟා, කෙටුම්පත සම්බන්ධයෙන් ඔවුන්ගේ දාර්ශනික අදහස් හා යෝජනා ලිඛිත ව හා වාචික ව ලබා ගන්නා ලදි. එම විද්වත් මණ්ඩලය සමන්විත වූයේ අධ්‍යාපන පද්ධතියේ ප්‍රතිපත්ති සම්පාදක තලය, විෂයමාලා සම්පාදක තලය, විධිමත් පාසල් අධ්‍යාපන ක්‍රියාවලිය හා සෘජු ව සම්බන්ධ සියලු පාර්ශ්ව, ළමා කායික හා මානසික සම්බරතාව වෙනුවෙන් කටයුතු කරන වෛද්‍ය වෘත්තීය නියෝජනය කරන පාර්ශ්ව, ළමා යුතුකම් අයිතිවාසිකම් සුරැකීමට කටයුතු කරන පාර්ශ්ව, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය නියෝජනය කරන පාර්ශ්ව, වෘත්තීය අධ්‍යාපන අවස්ථා සම්පාදනය කරන පාර්ශ්ව, පෞද්ගලික අංශය නියෝජනය කරන පාර්ශ්ව, රාජ්‍ය නොවන සහ පෞද්ගලික අංශයේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන ප්‍රවීණයන්ගෙනි.

## යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කෙටුම්පත සම්බන්ධ පර්යේෂණය

විද්වත් මත විමසුමට අමතර ව, පර්යේෂණාත්මක පදනමක් මත පිහිටා යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කෙටුම්පත සම්බන්ධයෙන් අධ්‍යාපන පද්ධතියේ ක්‍රියාත්මක තලය නියෝජනය කරන අධ්‍යාපනය හා සබැඳි පාර්ශ්වකරුවන්ගේ මත විමසුමක් ද සිදු කරන ලදි. ඒ අනුව අධ්‍යාපන පද්ධතියේ ක්‍රියාත්මක තලය නියෝජනය කරන දිවයිනේ විවිධ පළාත් නියෝජනය කරන අධ්‍යාපන කළමනාකරුවන්, විදුහල්පතිවරුන්, ගුරු උපදේශකවරුන්, ගුරුවරුන් සහ දෙමාපියන් යන අධ්‍යාපන ක්ෂේත්‍රය හා සෘජු ව සම්බන්ධ පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිචාර විමසන ලදි. ඒ සඳහා දිවයිනේ බස්නාහිර පළාත, ඌව පළාත, දකුණු පළාත සහ උතුරු පළාත යන පළාත් හතර නියෝජනය වන පරිදි, 242ක නියැදියකින් ප්‍රශ්නාවලි සහ නාභිගත සම්මුඛ සාකච්ඡා ඇසුරින් දත්ත රැස් කරන ලදි.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවලිය සම්බන්ධයෙන් විද්වත් මත විමසුම සහ අධ්‍යාපනය හා සබැඳි පාර්ශ්වකරුවන්ගේ මත විමසුමෙන් ලබා ගන්නා ලද දත්ත ගුණාත්මක ව විශ්ලේෂණය කරන ලදි. ඒ අනුව ලද නිගමන ඇසුරින් එළඹි යෝජනා සංක්ෂිප්ත ව පහත දැක්වේ.

## 12 හා 13 ශ්‍රේණි සඳහා හඳුන්වා දෙන ලද නව වෘත්තීය විෂයධාරාව ආශ්‍රිත ප්‍රතිසංස්කරණ යෝජනා

අ.පො.ස. (සා.පෙ.) අවසන් කළ පසු පාසල් පද්ධතිය හැර යන්නන් සඳහා වෘත්තීය විෂයධාරාවක් හඳුන්වා දිය යුතු ය. මෙය පොදු සංරචකයකින් හා ව්‍යවහාරික විෂය සංරචකවලින් සමන්විත විය යුතු අතර පොදු සංරචකය අ.පො.ස. (සා.පෙ.) විභාගය අවසන් වීමත් සමග ම ආරම්භ කළ යුතු ය. මෙම විෂයධාරාව ක්‍රියාත්මක කිරීමට, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක අවම වශයෙන්, අවශ්‍ය පහසුකම් සහිත එක් පාසලක් වත් පිහිටුවිය යුතු අතර විවිධ විෂයධාරාවලට අවශ්‍ය භෞතික හා යටිතල පහසුකම් හා විෂයමාලා ද්‍රව්‍ය ඒවාට සැපයිය යුතු ය. පාඨමාලාව ක්‍රියාත්මක කිරීමේ දී විශේෂ අවශ්‍යතා සහිත සිසුන් හා විපතිතයන් (අතරමග දී පාසල් අධ්‍යාපනයෙන් ඇද හැලෙන සිසුන්) කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුත්තේ ය.

වෘත්තීය අධ්‍යාපන ප්‍රමිතිවලට අනුකූල ව විෂයධාරාව ක්‍රියාත්මක කළ යුතු අතර ඒ සඳහා විෂය සම්බන්ධ ප්‍රාමාණික ආයතනවල සහාය ලබා ගත යුතු ය. ඉගෙනුම්ලාභීන් සත්‍යාපනය හා ඇගයීම, වෘත්තීය අධ්‍යාපන ප්‍රමිතිවලට අනුකූල විය යුතු ය. විෂයධාරාවෙන් නිසි පරිදි සුදුසුකම් ලබන ශිෂ්‍යයන්ට උසස් වෘත්තීය අධ්‍යාපන සහතිකය (ACVE) ප්‍රදානය කළ යුතු අතර එය හා ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ) අතර සම්බන්ධතාව පිළිබඳ ව සමාජය දැනුම්වත් කළ යුතු ය.

## අ.පො.ස. (උ.පෙ.) 12 හා 13 ශ්‍රේණි ආශ්‍රිත ප්‍රතිසංස්කරණ යෝජනා

අ.පො.ස. (උ.පෙළ) විභාග සහතිකය, පාසල් හැර යෑමේ සුදුසුකමක් ලෙස පිළිගත යුතු ය. එය විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගයක් නොවිය යුතු අතර ශිෂ්‍යයාගේ ප්‍රාප්ති මට්ටම ඉන් පිළිබිඹු විය යුතු ය. සිසුනට 21වැනි සියවසෙහි වැඩ ලෝකයට අවශ්‍ය ප්‍රවීණතාව සාධනය කර ගැනීමට අවස්ථා සැලසීම, උසස් පෙළ අසමත් වන ශිෂ්‍යයනට වෘත්තියාභිමුඛ මාර්ගෝපදේශ සේවාවක් ආරම්භ කිරීම, පාසල් පාදක ඇගයීම් ක්‍රියාවලියේ විශ්වසනීයත්වය හා වලංගුතාව තහවුරු කිරීම, වර්තමාන පොදු සාමාන්‍ය පරීක්ෂණය පූර්ණ අභියෝගාත්මක පරීක්ෂණයක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීම, විශේෂිත ක්ෂේත්‍රවලින් තෝරා ගන්නා ලද විෂයය දෙකකින් හා විෂය කට්ටලයකින් තෝරා ගත් විෂයයකින් යුක්ත වන සේ විෂය සංයෝජනය සිදු කිරීම එම යෝජනා අතර වේ. එසේ උසස් පෙළ සඳහා අඩු ඉල්ලුමක් සහිත විෂය විභාගයෙන් බැහැර කිරීම, වැඩි පිරිසකගේ එකඟතාව ප්‍රකාශ වූ අනෙකුත් ප්‍රධාන යෝජනාව විය.

## අ.පො.ස. (සා.පෙ.) 10 හා 11 ශ්‍රේණි ආශ්‍රිත ප්‍රතිසංස්කරණ යෝජනා

අ.පො.ස. (සා.පෙ.) සිසුන් විසින් උගත යුතු හර විෂය සංඛ්‍යාව හයක් විය යුතු අතර, එක් එක් විෂයය ඉගැන්වීමට සතියකට වෙන් කරන කාලච්ඡේද සංඛ්‍යාවට සමාන බරක් තැබිය යුතු ය. අ.පො.ස. (සා.පෙ.) විභාග ප්‍රතිඵල, ශ්‍රේණි ලෙස මෙන් ම 0-5 පරිමාණය තුළ පිහිටි ශ්‍රේණි ලකුණු සාමාන්‍යයකින් (GPA) ද නිකුත් කළ යුතු ය. ආගම් හා සාරධර්ම ඉගැන්වීමේ දී අනෙකුත් ආගම් හා සංස්කෘති පිළිබඳ ව ද හැදෑරීම සුදුසු වන අතර එහි දී ආගමික ස්ථානවල සහාය ද ලබා ගත යුතු ය. එදිනෙදා ජීවිතයට අත්‍යවශ්‍ය නිපුණතා පදනම් කර ගනිමින් ගණිතය හා විද්‍යාව විෂයවල අන්තර්ගතය අභිවර්ධනය කළ යුතු අතර, ඉතිහාසය හා සමාජ අධ්‍යයනය විෂයය සමෝධානයේ දී අන්තර්ගතය පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය. තොරතුරු තාක්ෂණය, ශාරීරික අධ්‍යාපනය වැනි ඇතැම් විෂය සැලකිය යුත්තේ හර විෂය ලෙස ද, නැතහොත් කාණ්ඩ විෂය ලෙස ද යන්න පිළිබඳ ව තව දුරටත් විමසා බැලිය යුතු ය.



## ප්‍රාථමික අධ්‍යාපනය ආශ්‍රිත ප්‍රතිසංස්කරණ යෝජනා

ප්‍රාථමික පාසල් විෂයමාලාව එක්සත් ජාතීන්ගේ ප්‍රමිතිවලට අනුකූල ව 6-11 ශ්‍රේණිවල විෂය හය සමග තර්කානුකූල ව සම්බන්ධ විය යුතු ය. සංවර්ධිත රටවල ප්‍රාථමික විෂයමාලාවේ ස්වභාවයට අනුගත විය යුතු ය. දේශීය, ජාතික සහ සංස්කෘතික පදනම් මත සකස් කළ යුතු ය. එය ගොඩනැඟිය යුත්තේ ළමා සංවර්ධනය පිළිබඳ මනෝ විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක මූලධර්මවලට අනුකූල ව ය. ඉන් ළමයින්ගේ චිත්තවේගීය, සංස්කෘතික හා ආධ්‍යාත්මික ස්ථායීතාව සඳහා පදනම වැටිය යුතු ය.

වෙනස් ලෙස සැලකීමෙන් තොර ව භාෂා හා සන්නිවේදන නිපුණතා සංවර්ධනයට හිතකර පංති කාමර පරිසරයක් ගොඩනැංවිය යුතු අතර, පළමු වන ශ්‍රේණියේ සිට ස්වභාෂාව සමග ඉංග්‍රීසි භාෂාව ඉගැන්විය යුතු ය. ප්‍රාථමික ගුරුවරුන් බඳවා ගැනීම කුසලතාතන්ත්‍රය මත පමණක් සිදු විය යුතු අතර, ඒ සඳහා නිර්ණායක සකස් කොට ගුරු පුහුණුවේ ප්‍රමිතිවල විෂමතා ඉවත් කළ යුතු ය. අධීක්ෂණ හා නියාමන වැඩපිළිවෙළකින් ගුරු පුහුණුවේ ඵලදායීතාව සුරක්ෂිත කොට ගුරු පුහුණුකරුවන්ගේ සංචිතයක් පිහිටුවිය යුතු ය.

ප්‍රාථමික විෂය මූලිකාංග සිරස් හා තිරස් සමෝධානමය පදනමක් යටතේ සලකා බලමින් හා මූලික නිපුණතා සංවර්ධනය ඉලක්ක කර ගනිමින් විෂය නිර්දේශ සකස් කළ යුතු අතර යෝජිත විෂය මූලිකාංග සත්‍යාපනයට හා ඇගයීමට විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතු ය. එසේ ම ප්‍රාථමික විෂයමාලාවෙන් විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ ඉදිරි මග විවෘත විය යුතු ය.

# අනාගත වැඩලෝකයට ගැළපෙන මානව සම්පත් ගොඩනංවන

## 13 වසරක සහතික අධ්‍යාපන වැඩසටහන




අධ්‍යාපනයෙන් සිදු විය යුත්තේ දරුවාගේ සහජ දක්ෂතා මතු කර ගැනීමට ඉඩ හසර ලබා දී ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම වුව ද පවත්නා අධ්‍යාපන ක්‍රමයේ දැඩි ව්‍යුහගත ස්වභාවය සිසු අවශ්‍යතාවලට නොගැළපීම, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආකර්ෂණීය නොවීම, තක්සේරුකරණ සහ ඇගයීම් ක්‍රමවේදය ප්‍රායෝගිකත්වයෙන් බැහැර ව දැනුම පමණක් මැන බැලෙන ආකාරයෙන් පැවැතීම වැනි හේතු නිසා පළමු ශ්‍රේණියට ඇතුළත් වන ශ්‍රී ලාංකික දරුවන්ගෙන් විශාල ප්‍රතිශතයක් අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් පසු වැඩ ලෝකයට පිවිසීමට අවැසි නිපුණතා ලබා ගැනීමෙන් තොර ව අධ්‍යාපනය ප්‍රවාහයෙන් ඈඳ හැලෙයි.

ඒ අනුව විවිධ ක්ෂේත්‍රවල දක්ෂතා, කුසලතා, නිර්මාණාත්මක හැකියා සහිත සිසුනට ඒ ඒ ක්ෂේත්‍රවලින් ඉදිරියට යාමේ මං අවුරා ශාස්ත්‍රීය නැඹුරුවකට තල්ලු කර දැමීමේ අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ කිසිදු නිපුණතාවකින් සහ අනාගත අපේක්ෂාවකින් තොර ව ඔවුන් සමාජයට එක්වීමයි. මෙය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික අර්බුද රැසක් නිර්මාණය කිරීමට ද ඉවහල් වී ඇත. නූතන තාක්ෂණික හා විද්‍යාත්මක ලෝකය තුළ කාලයේ වේගය අභිබවා ගොඩ නැගෙන විවිධ දැනුම් ක්ෂේත්‍ර සමග ඉතා ඉහළ වැටුප් තල සහිත රැකියා රැසක් නිර්මාණය වී තිබුණ ද ඒ සඳහා පුහුණු ශ්‍රමිකයන් නොමැති වීම ද රටක් ලෙස ශ්‍රී ලංකාව මුහුණ දෙන තවත් විශාල ගැටලුවකි.

මෙම තත්ත්ව මනා සේ හඳුනා ගත් වර්තමාන රජය, විවිධ දක්ෂතා, කුසලතා, හැකියා සහිත ව සිටිය ද එය මතු කර ගැනීමට ඉඩක් නොමැති වීම නිසා, ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයට පිවිසීමට වරම් නොලැබ වසර 11ක අධ්‍යාපනයෙන් පසු පාසලෙන් ඉවත් වීමට නියමිත දරුවන් තවත් වසර දෙකක් පාසලේ රඳවා ගෙන ඔවුන්ගේ එම දක්ෂතා, නිපුණතා ඔප මට්ටම් කර දේශීය හා ගෝලීය වශයෙන් විවර වී ඇති විවිධ වෘත්තීන් වෙත ළඟා වීම සඳහා මංපෙත් විවර කර දීමේ අරමුණින්, දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන හඳුන්වා දී ඇත.

රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශනය ''2025 දැක්ම'' (Vision 2025) ට අනුව, ශ්‍රී ලංකා රජය, දැඩි ලෙස තරඟකාරී වූ සමාජ වෙළෙඳ පොළ ආර්ථික ප්‍රතිපත්තිවල පිටුබලය ලබමින්, අප රට, දැනුම ආර්ථික කේන්ද්‍රයක් බවට පරිවර්තනය කිරීම වෙනුවෙන් කැප වී සිටී. මෙහි දී ආර්ථිකයට සක්‍රිය දායකත්වයක් ලබා දීම උදෙසා තාරුණ්‍යය බල ගන්වමින් කුසලතා පූර්ණ අධ්‍යාපනයකට දිශානත කිරීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ. ඒ අනුව සැමට දහතුන් වසරක අධ්‍යාපනය ලැබීමට පහසුකම් සැපයීමත්, එමගින් තෘතීයික අධ්‍යාපන ප්‍රවේශය වැඩි කිරීමත්, වෘත්තීය පුහුණුව සඳහා අවස්ථා පුළුල් කිරීමත් ආරම්භ කර තිබේ.

මේ අනුව වර්තමාන රජයේ 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන යෝජනාව යටතේ සැම ඉගෙනුම් ලාභියකුට ම අ.පො.ස. (සා.පෙ.) විභාගයට පෙනී සිටීමෙන් පසු පද්ධතියෙන් ගිලිහී යාමෙන් තොර ව තම අධ්‍යයන කටයුතු 13 වන ශ්‍රේණියේ අවසානය දක්වා ම අඛණ්ඩ ව කර ගෙන යෑමට ඉඩ සැලසෙයි. මෙම 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආකර්ෂණීය වූත්, වැඩ මිතුරු වූත්, වැඩ ලෝකයට පිවිසීමට අවැසි නිපුණතා අත්පත් කර ගත හැකි වූත්, අනාගතවාදී පර්යාලෝකයකින් යුතු ව්‍යායාමයක් බවට පත් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපන මට්ටමේ දී ''වෘත්තීය විෂයධාරාව'' යනුවෙන් හැඳින්වෙන නව විෂය ධාරාවක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දී ඊට අදාළ විෂය නිර්දේශ සහ මොඩියුල සකස් කර ඇත. 2017 වර්ෂයේ දී නියාමන වැඩසටහනක් ලෙස පළමු අදියරේ දී පාසල් 42ක ආරම්භ කර, 2018 වර්ෂයේ දී තවත් පාසල් 154ක ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව මේ වන විට පළමු අදියරේ පාසල් 42හි සිසුන් තමාට සුවිශේෂී වූ ක්ෂේත්‍රයක වෘත්තීය අධ්‍යාපනය ලැබීමට තෘතීයික හා වෘත්තීය ආයතන වෙත යොමු කර තිබේ. දෙවන අදියර පාසල් 154හි වෘත්තීය විෂය 26ට අදාළ අතරමැදි මොඩියුල ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අනුව මෙම විෂයධාරාව ව්‍යවහාරික විෂය ක්ෂේත්‍රයට අදාළ භාවිත වැඩ මිතුරු විෂයමාලාවක් ඔස්සේ වෘත්තීය විෂයධාරාව ක්‍රියාත්මක කෙරේ. රජයේ ප්‍රතිපත්තිමය තීරණ අනුව 2019 වර්ෂයේ ජූනි මස සිට තවත් පාසල් 112ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය. හඳුන්වා දුන් නව වෘත්තීය විෂයධාරාව ප්‍රධාන සංරචක තුනකින් සමන්විත ය.



# වෘත්තීය විෂය ධාරාවේ ප්‍රධාන සංරචක

## [1] පොදු විෂය සංරචකය

වසර 11ක් පුරා සාමාන්‍ය පොදු විෂයමාලාවක් හදාරන සිසුන්, වෘත්තීය නිපුණතා අත්පත් කර ගැනීමට පෙර, ඔවුන්ගේ මෘදු කුසලතා සංවර්ධනය කිරීමත් ව්‍යවහාරික/ වෘත්තීය විෂය හැදෑරීම සඳහා දිශාභිමුඛ කිරීමත් අරමුණු කර ගෙන, පොදු කුසලතා අත්පත් කර ගැනීම සඳහා මොඩියුල ඇසුරෙන් පොදු විෂය සංරචකය ක්‍රියාත්මක කෙරේ.

- පළමු බස : සිංහල/ දෙමළ සන්නිවේදන කුසලතා
- ව්‍යාපාර ඉංග්‍රීසි හා සන්නිවේදන කුසලතා
- සෞන්දර්යාත්මක රසවින්දන කුසලතා
- තොරතුරු හා පරිගණක තාක්ෂණ කුසලතා
- පුරවැසිභාවය ආශ්‍රිත කුසලතා
- සමාජ යහපැවැත්ම උදෙසා සෞඛ්‍ය හා ජීවන කුසලතා
- ව්‍යවසායකත්ව කුසලතා
- වෘත්තීය මාර්ගෝපදේශය
- විෂය බාහිර : ක්‍රීඩා, සමිති සමාගම් ආදි

## [2] ව්‍යවහාරික/ වෘත්තීය විෂය සංරචකය

විවිධ ක්ෂේත්‍ර ඔස්සේ වැඩ ලෝකයට පිවිසීම සඳහා අවශ්‍ය සාධනාත්මක දැනුම හා නිපුණතා අත්පත් කර ගත හැකි වන පරිදි පහත දැක්වෙන විෂය ක්ෂේත්‍ර හතට අදාළ ව ව්‍යවහාරික/ වෘත්තීය විෂය 26ක් නිර්මාණය කර ඇත.

### සෞඛ්‍ය හා සමාජ සේවා:

1. ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය
2. සෞඛ්‍යය හා සමාජ ආරක්ෂණය
3. ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා

### සමාජ - සංස්කෘතික අධ්‍යයන:

4. ප්‍රාසාංගික කලා
5. කාර්යසිද්ධි කළමනාකරණය
6. ශිල්ප කලා

### නිර්මාණකරණය:

7. අභ්‍යන්තර නිර්මාණකරණය
8. විලාසිතා නිර්මාණකරණය
9. ග්‍රැෆික් නිර්මාණකරණය
10. කලාව හා පිරිසැලසුම්කරණය
11. වෙබ් නිර්මාණකරණය
12. භූ දර්ශන නිර්මාණකරණය

### කෘෂි හා ආහාර තාක්ෂණවේදය:

13. ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය
14. පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය
15. ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය
16. ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය
17. වැවිලි බෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය

### තාක්ෂණික අධ්‍යයන:

18. ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය
19. මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය
20. විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය
21. පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය
22. ලෝහ පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය
23. ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය
24. මෘදුකාංග සංවර්ධනය

### සංචරණය හා ආගන්තුක සත්කාරය:

25. සංචරණය හා ආගන්තුක සත්කාරය

### පරිසරය ආශ්‍රිත අධ්‍යයන:

26. පාරිසරික අධ්‍යයන

ව්‍යවහාරික/ වෘත්තීය විෂය 26 ක්‍රියාත්මක කරනු ලබන්නේ මොඩියුල තුනක් ඇසුරෙනි. ඒවා නම්,

I. හඳුන්වා දීමේ මොඩියුලය
II. අතරමැදි මොඩියුලය
III. උසස් මොඩියුලය -1 කොටස
IV. උසස් මොඩියුලය -11 කොටස

## (3) කර්මාන්ත ඇසුරෙන් ක්ෂේත්‍ර පුහුණුව

ශිෂ්‍යයන් විසින් තෝරා ගනු ලබන ප්‍රධාන ව්‍යවහාරික/ වෘත්තීය විෂයයට අදාළ ව කර්මාන්ත ඇසුරෙන් සිදු කෙරෙන කාර්යානුබද්ධ පුහුණුව තුන් වන සංරචකයට ඇතුළත් වේ.

## 12 වන ශ්‍රේණියේ වෘත්තීය විෂයමාලාව ක්‍රියාත්මක කිරීම

12 වන ශ්‍රේණියේ පළමු වාරයේ දී, පොදු කුසලතා මොඩියුලය, ඇසුරෙන් පළමු වන විෂය සංරචකය වන පොදු විෂය සංරචකය, ක්‍රියාත්මක කෙරෙන අතර ඒ සඳහා පැය 360ක කාලයක් වෙන් කර ඇත. අනතුරු ව, 12 ශ්‍රේණියේ දෙවන හා තුන්වන වාරවල දී, දෙවන සංරචකය වන, ,ව්‍යවහාරික/වෘත්තීය විෂය සංරචකය, යටතේ ඇති විෂය 26න් 3ක් තෝරා ගෙන අවට ප්‍රදේශවල පුහුණු කුසලතා, පූර්ණ මානව සම්පත් හා පාසලේ දී ලැබෙන ප්‍රයෝජනවත් දැනුම්වත් බව ඒකාබද්ධ කොට, ක්‍රියාත්මක කෙරේ. ව්‍යවහාරික/වෘත්තීය විෂය දැනුම හා ප්‍රායෝගික පදනම ඇති කිරීම සඳහා පිළිවෙළින් හඳුන්වා දීමේ මොඩියුලයේ හා අතරමැදි මොඩියුලයේ ඇතුළත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරෙන් තනි ව හෝ කණ්ඩායමක් ලෙස ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යෙදී-මෙන්, තම න්‍යායික දැනුම් පදනම, සැබෑ ජීවිතයේ දී භාවිතයට ගැනීම සම්බන්ධ අත්දැකීම් ලබා ගැනීමට සිසුනට ඉඩ සැලසේ.



## 13 වන ශ්‍රේණියේ වෘත්තීය විෂයමාලාව ක්‍රියාත්මක කිරීම

13 වන ශ්‍රේණිය පළමු සහ දෙවන වාරවල දී සිසුන්ට, තමන් තෝරා ගන්නා ලද විෂය තුනෙන් එක් විෂයයකට අදාළ ව උසස් මොඩියුලය ඉගෙනීමටත් කර්මාන්ත ආශ්‍රිත ව ක්ෂේත්‍ර පුහුණුව ලබා ගැනීමටත් අවස්ථාව ලැබේ. මෙහි දී සිසුන් විසින් තමන් වාසය කරන ප්‍රදේශයේ පවත්නා, තමා විසින් තෝරා ගන්නා ලද ප්‍රධාන ව්‍යවහාරික/ වෘත්තීය විෂයයට ගැළපෙන නවීන මෙන් ම සාම්ප්‍රදායික කර්මාන්ත, පාසලේ අනුග්‍රහය මත තෝරා ගනු ලබනු ඇත. 13 වසර තුන්වන වාරයේ දී කර්මාන්ත ඇසුරෙන් නිපැයුම් පදනම් කර ගත් ව්‍යාපෘති කාර්යයක් සමග වෘත්තීය නිපුණතා අත්පත් කර ගැනීමට අවස්ථාව සලසා ඇත.



## තක්සේරුකරණය හා ඇගයීම

ඉගෙනුම්ලාභීන් පිළිබඳ තක්සේරුකරණය හා ඇගයීම, සාම්ප්‍රදායික රටාවෙන් වෙනස් ව සිදු කෙරේ. එහි දී වෘත්තීය අධ්‍යාපන ප්‍රමිතිවලට අනුකූල ව, ප්‍රායෝගික සංරචක අඩංගු නවීන ක්‍රමවේද අනුගමනය කරනු ලැබේ. ඒ අනුව එක් එක් ශිෂ්‍යයාගේ ප්‍රගතිය අඛණ්ඩ ව විමසනු පිණිස, වාර්තාකරණ යාන්ත්‍රණයක් සහිත වූ ද මනා ව ව්‍යුහගත කරන ලද්දා වූ ද කාර්යසාධන ගොනු ආශ්‍රිත ව, පාසල් පාදක සහ කර්මාන්ත ශාලා පාදක සම්භවන තක්සේරුකරණ ක්‍රමයක් ක්‍රියාත්මක කෙරේ.

වසර දෙක අවසානයේ දී, 12 හා 13 ශ්‍රේණිවල ප්‍රායෝගික ඉගෙනුමට අදාළ ව, කර්මාන්ත ඇසුරෙන් ලබා ගත් වෘත්තීය පුහුණුවේ දී ලද අත්දැකීම් මත සිසුන් ව්‍යාපෘති වාර්තාවක් සකස් කරනු ඇත. එසේ ම සම්පිණ්ඩිත ඇගයීමකට ද සිසුන් පෙනී සිටීමට නියමිත ය. සිසුන් පිළිබඳ කාර්යසාධන ගොනු ආශ්‍රිත සම්භවන තක්සේරුකරණ වාර්තා, සම්පිණ්ඩිත ඇගයීම සමග ඒකාබද්ධ කර, සහතිකකරණයට යොමු කෙරේ.



වෘත්තීය විෂයධාරාවෙන් නිසි පරිදි පුහුණුකම් ලබන සිසුන්ට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් උසස් වෘත්තීය අධ්‍යාපන සහතික (ACVE) ප්‍රදානය කෙරෙන අතර වෘත්තීය නිපුණතා මත NVQ 4 මට්ටම ලබා ගැනීමට ද සිසුන් යොමු කරනු ඇත. වසර දෙක අවසානයේ, රැකියාවකට පිවිසීමට, ස්වයං රැකියාවක නිරත වීමට හෝ තෘතීයික අධ්‍යාපනය හදාරා NVQ මට්ටම් ඔස්සේ උසස් වෘත්තීය පුහුණුකම් ලබා ගැනීමට ද, තවදුරටත් තාක්ෂණ පාඨමාලාවලට අදාළ ව විශ්වවිද්‍යාල උපාධි හැදෑරීමෙන්, වෘත්තීය උපාධිධාරීන් වීමට ද සිසුන්ට අවස්ථාව සැලසේ.

# 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන:

වර්තමාන ශ්‍රී ලංකා අධ්‍යාපන පද්ධතියේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික දෙවන අදියර, විෂයධාරා පහක් ඔස්සේ ක්‍රියාත්මක ය. වෘත්තීය විෂයධාරාව එහි හය වන විෂයධාරාව ලෙස 2017 වසරේ අවසන් භාගයේ සිට හඳුන්වා දෙන ලදී. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා පෙනී සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට, සමත් අසමත්භාවයකින් තොර ව වෘත්තීය අධ්‍යාපනයෙන් අනාගත වැඩ ලොව ජය ගැනීම, සඳහා මං පෙත් විවර කර දීම මෙහි ප්‍රධාන අරමුණ වේ. 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන ලෙස හඳුන්වා දෙනු ලබන මෙම විෂයධාරාව වැඩ ලොව ජය ගැනීම සඳහා වන මූලික නිපුණතා, විෂය නිපුණතා හා ප්‍රායෝගික භාවිතය යන අංශ සැලකිල්ලට ගෙන ඇත. 12 වන ශ්‍රේණියේ පළමු වාරය සඳහා වැඩ ලෝකයට අවශ්‍ය මූලික නිපුණතා ලබා දීමේ අපේක්ෂාවෙන් පොදු විෂය සංරචකය යටතේ විෂය 8ක් හඳුන්වා දී ඇත. ඉන් එක් විෂයයක් වන්නේ වෘත්තීය මාර්ගෝපදේශ විෂයය යි.

හඳුන්වා දුන් වෘත්තීය මාර්ගෝපදේශ විෂයයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ පුද්ගලයාගේ සමස්ත පුද්ගල පෞරුෂයට ගැළපෙන, වැඩලොව තුළ පවතින නිසි ස්ථානය පිළිබඳ විධිමත් අවබෝධයක් ලබා දීම යි. ඒ අනුව පැය 60ක කාල පරාසයක දී සම්පූර්ණ කිරීමට නියමිත මෙම විෂය පථය ප්‍රධාන විෂයයන් ම වෘත්තීය සංවර්ධන ක්‍රියාවලිය මත පදනම් ව සංවර්ධනය කොට ඇත. වෘත්තීය සංවර්ධන ක්‍රියාවලිය ප්‍රධාන පියවර හතරකින් ගොඩ නැඟී ඇත. තමා හඳුනා ගැනීම (Self Awareness), වැඩ ලෝකයේ ඇති අවස්ථා ගවේෂණය (Explore World of Work), තීරණ ගැනීම (Decission Making) සහ වෘත්තීය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම (Career Planning and Implementation) යනු එම පියවර වේ.

විවිධ පෞරුෂ පරීක්ෂණ මඟින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සතු අභ්‍යන්තර ශක්තීන්, හැකියා, ලැදියා, පෞරුෂ ආකාර හඳුනා ගැනීම තමා හඳුනා ගැනීමේ පියවරෙන් අපේක්ෂා කෙරේ. තම හැකියා, ලැදියා, පෞරුෂ ගති ලක්ෂණවලට උචිත වැඩ ලොව රැකියා/ වෘත්තීය අවස්ථා පුළුල් අන්දමින් ගවේෂණය කිරීම දෙවන පියවරෙන් අපේක්ෂා කෙරේ. ශ්‍රම වෙළෙඳපොළ දිනෙන් දින වෙනස් වන නව ප්‍රවණතාවලින් යුක්ත සංරචකයකි. එබැවින් දේශීය හා විදේශීය රැකියා/ වෘත්තීය අවස්ථා පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගත යුතු වීම අනිවාර්ය වේ. පුළුල් අධ්‍යාපනයක් මඟින් තමාට වඩා උචිත ක්ෂේත්‍රවලට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලඟා විය හැකි ය. මෙහි දී විශේෂ අවධානයක් යොමු කොට ඇත්තේ, ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෘත්තීය විෂයධාරාව යටතේ තෝරා ගැනීමට නියමිත විෂයවලට අදාළ ව, ශ්‍රම වෙළෙඳ පොළ පවත්නා රැකියා/ වෘත්තීය අවස්ථා කෙරෙහි ය.

ශ්‍රම වෙළෙඳ පොළ ගවේෂණයෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තමාගේ ශක්තීන්ට වඩා උචිත රැකියා/වෘත්තීය ක්ෂේත්‍ර මොනවා ද යන්න පිළිබඳ යම් අවබෝධයක් ලබා ගත හැකි ය. තෙවන පියවරෙහි දී පළමු හා දෙවන පියවර තුලනය කොට තමාට වඩා ගැළපෙන ක්ෂේත්‍ර සඳහා විකල්ප අවස්ථා අතරින් හොඳ ම විකල්ප සඳහා තීරණ ගැනීම සිදුවේ. හතරවන පියවරේ දී තෙවන පියවරේ දී ලබා ගත් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා කෙටි කාලීන හා දිගු කාලීන සැලසුම් සකස් කිරීම හා ඒවා ක්‍රියාවේ යෙදවීමට සැලසුම් සකස් කිරීමට අපේක්ෂිත ය.

ඒ අනුව වෘත්තීය මාර්ගෝපදේශ මොඩියුලය ප්‍රධාන තේමා 4ක් පදනම් කොට සංවර්ධනය කර ඇත.

වෘත්තීය සංවර්ධන ක්‍රියාවලියේ දී සමස්ත වැඩ ලෝකයට අවශ්‍ය ආකල්ප හා කුසලතා සංවර්ධනය අත්‍යවශ්‍ය කරුණකි. වර්තමානය වන විට බටහිර රටවල් මේ පිළිබඳ දැඩි අවධානයක් යොමු කොට ඇත. අධ්‍යාපනික හෝ වෘත්තීය කුසලතා ප්‍රමාණවත් ව තිබුණ ද වැඩ ලොව තුළ එම කුසලතා ප්‍රදර්ශනය නො කිරීමෙන් වෘත්තීයභාවය පිළිබඳ ගැටලු පැන නැඟිය හැකි ය. එබැවින් වැඩ ලොව සඳහා අවශ්‍ය ආකල්ප හා කුසලතා පාසල් කාලයේ දී ම ශිෂ්‍ය ශිෂ්‍යාවන් ප්‍රගුණ කළ යුතු ව තිබේ. මේ පිළිබඳ අවධානය යොමු කොට වැඩ ලොවට අවශ්‍ය කුසලතා පිළිබඳ අවධානයක් යොමු කරන ලදී. එහි දී වැඩ ලොව තුළ සාර්ථක වෘත්තීය පෞරුෂ ගොඩ නැඟීමේ අභිප්‍රායෙන් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා විනෝදජනක ක්‍රීඩා ආශ්‍රයෙන් ආකල්ප හා මෘදු කුසලතා සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කෙරේ.

වැඩ ලොවට ප්‍රවිෂ්ට වන සිසුන් විසින් තවදුරටත් ප්‍රගුණ කළ යුතු ප්‍රධාන කුසලතාවක් වන්නේ ඉදිරිපත් කිරීමේ කුසලතා යි (Presentation Skills). මේ සම්බන්ධයෙන් විධිමත් ව අත්දැකීම් ලබා දීම ද වෘත්තීය මාර්ගෝපදේශ විෂය මොඩියුලයේ අරමුණකි.

ශිෂ්‍යයින් කොතරම් අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් ලබා තිබුණ ද යාවත්කාලීන හා වර්තමානයට උචිත අන්දමෙන් අයදුම්පතක් එනම් Curriculum Vitae (CV) හා ඊට අදාළ ආවරණ ලිපියක් (Covering Letter) ආයතනයකට යොමු නො කිරීම මත බොහෝ වෘත්තීය අවස්ථා මඟ හැරී යාමට හැකි ය. එබැවින් පිළිගත් ක්‍රමවේදයකට අනුව එම කර්තව්‍යය කිරීමේ නිපුණතාව පාසල් කාලයේ දී ම ශිෂ්‍යයන් සතු විය යුතු ය. ශ්‍රම වෙළෙඳ පොළට උචිත කුසලතා අත්පත් කරගෙන කිසියම් ආයතනයක වෘත්තියක් සඳහා අවතීර්ණ වීමේ දී ශිෂ්‍යයන් සතු විය යුතු තවත් නිපුණතාවක් වනුයේ විධිමත් ව සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දෙන ආකාරය පිළිබඳ නිසි අවබෝධය යි. මෙම ශක්‍යතා යමෙකුගේ යාවත්කාලීන දැනුම, පෞරුෂය පෙන්වන කැඩපතක් වන අතර, මේ සම්බන්ධයෙන් ද විධිමත් දැනුම්වත් කිරීමක් වෘත්තීය මාර්ගෝපදේශ මොඩියුලයෙන් සිදු කෙරේ. ඒ අනුව ක්‍රියාකාරකම් පාදක ව ගොඩ නගා ඇති මෙම සමස්ත මොඩියුලයෙන් ශිෂ්‍යයන්ට ප්‍රායෝගික අත්දැකීම් සහිත ව අනාගත ශ්‍රම වෙළෙඳපොළට පිවිසීමට ඇති අවස්ථා සඳහා යම් විධිමත් මඟ පෙන්වීමක් ලබා දීමට උත්සාහ දරා ඇත.

පැය 60ක කාල සීමාව තුළ මෙම විෂය හඳුන්වා දීමේ එක් අරමුණක් වනුයේ වෘත්තීය විෂයධාරාවේ විෂය අතුරින් තමාට වඩාත් ම ගැළපෙන විෂය තෝරා ගැනීමට ශිෂ්‍යයන්ට මූලික මඟ පෙන්වීමක් ලබා දීම යි. මෙමඟින් ශිෂ්‍යයන්ට පැහැදිලි ඉලක්ක සමඟ වෘත්තීය විෂයධාරාවේ විෂය 26න් වඩා ම උචිත විෂය ක්ෂේත්‍ර සමඟ ඉදිරියට යාමට අවස්ථාව සැලසේ. එසේ ම පාසල් කාලයේ දී ම තම ඉදිරි වෘත්තීය අවස්ථා විධිමත් ව සැලසුම් කිරීමට හැකියාවක් ලැබෙනු ඇත. ඒ අනුව වෘත්තීය විෂයධාරාවේ පොදු විෂය සංරචකයෙහි අඩංගු වෘත්තීය මාර්ගෝපදේශ විෂයය, අනෙක් විෂයවලින් වෙනස් සංරචකයන් අඩංගු විෂයයක් ලෙස අවධාරණය කළ හැකි ය.



# නව පාඨමාලා සහ පාඨමාලා ව්‍යුහයේ නව සංශෝධන සමග ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවෙන් වසරකට විභාග 30ක්

අධ්‍යාපන ක්ෂේත්‍රයේ මේ වන විටත් නිරත ව සිටින සහ ඉදිරියේ දී නිරත වීමට අපේක්ෂාවෙන් සිටින පිරිස් බල ගැන්වීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය, පවතින පාඨමාලා ව්‍යුහයෙහි සංශෝධන සිදු කිරීමට සහ නව පාඨමාලා හඳුන්වා දීමට පියවර ගෙන තිබේ. ඒ අනුව, විභාග දෙපාර්තමේන්තුව විසින් වසරක් තුළ පවත්වන විභාග සංඛ්‍යාව ද මේ වන විට 30කට ආසන්න සංඛ්‍යාවක් දක්වා ඉහළ ගොස් තිබේ.

උපාධි, ඩිප්ලෝමා, පශ්චාත් උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා පාඨමාලා පැවැත්වීමටත්, ඊට අදාළ විභාග පැවැත්වීමටත්, 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතේ 5 වන ඡේදය හා ඊට සම්බන්ධ අනුඡේද මගින් ජාතික අධ්‍යාපන ආයතනයට බලතල හිමි වී ඇත. ඒ අනුව ජාතික අධ්‍යාපන ආයතනය ආරම්භක අවධියේ, එක් එක් පාඨමාලා ක්‍රියාත්මක කළ දෙපාර්තමේන්තු හෝ අංශ මගින් ම ඒ ඒ පාඨමාලාවට අදාළ විභාග පවත්වන ලදී. පසු ව, 1998 දී සහකාර අධ්‍යක්ෂ ජනරාල්වරයකු යටතේ, ශාස්ත්‍රීය කටයුතු හා විභාග අංශය මෙන් ම ශිෂ්‍ය කටයුතු අංශයක් ද ආරම්භ කර, පසු ව විභාග දෙපාර්තමේන්තුව ලෙස ප්‍රතිව්‍යුහගත කරන ලදී. විභාග දෙපාර්තමේන්තුව සෘජු ව ම අධ්‍යක්ෂ ජනරාල් යටතේ ක්‍රියාත්මක වන අතර, විභාග සංවිධාන අංශය, රහස්‍ය අංශය, ඇගයීම් අංශය, ප්‍රතිඵල අංශය, සහතික පත්‍ර අංශය හා පරිගණක ඒකකය වශයෙන් මේ වන විට අංශ 06ක් යටතේ ක්‍රියාත්මක වේ.

ආරම්භක අවධියේ, ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුව විසින් පාඨමාලා හයකට අදාළ සීමිත විභාග සංඛ්‍යාවක් වසරකු දී පවත්වන ලදී.



ආයතනයේ විවිධ දෙපාර්තමේන්තු මගින් නව පාඨමාලා ආරම්භ කිරීමත් සමග, විභාග දෙපාර්තමේන්තුවේ කාර්ය ද වඩාත් පුළුල් විය. ඒ අනුව වසරක දී විභාග 20ක් පමණ වසර පහක කාල සීමාවේ දී පවත්වා ඇත. ජාතික අධ්‍යාපන ආයතනයේ විවිධ දෙපාර්තමේන්තු මගින් පවත්වන පාඨමාලාවලට අදාළ විභාගවලට අමතර ව, අධ්‍යාපන අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන මගින් ඉල්ලුම් කරන විභාග ද පවත්වා ඇත.

නව පාඨමාලා ආරම්භ කිරීම හා පාඨමාලා ව්‍යුහය වෙනස් කිරීමත් සමග 2019 වසර තුළ විභාග 27ක් පැවැත්වීමට යෝජනා වී ඇති අතර ඊට අමතර ව විශේෂ ප්‍රනර් පරීක්ෂණ ද පවත්වනු ලැබේ. ඒ අනුව 2019 වසරේ දී පැවැත්වෙන සමස්ත විභාග සංඛ්‍යාව 30කට ආසන්න ය.

ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුව මගින්

## විභාග පවත්වනු ලබන පාඨමාලා


- අධ්‍යාපනපති උපාධි පාඨමාලාව
- අධ්‍යාපන කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව (මාලදිවයින් පාඨමාලාලාභීන් සඳහා)
- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව
- පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
- අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා (සාමාන්‍ය උපාධි) සහ (විශේෂ උපාධි)
- අධ්‍යාපනවේදී උපාධි (කළමනාකරණ) පාඨමාලාව (මාලදිවයින් පාඨමාලාලාභීන් සඳහා)
- පාසල් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
- මුල් ළමාවිය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව
- විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව
- සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලාව
- ගණිතය ඉගැන්වීම පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව
- බ්‍රේල් අධ්‍යාපන සහතික පත්‍ර පාඨමාලාව
- උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව
- අතිරේක භාෂා සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව
- පාසල් උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව
- දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- කොරියානු භාෂා ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා පාඨමාලාව
- විදේශ භාෂාවක් ලෙස ජපන් භාෂාව ඉගැන්වීමේ පාඨමාලාව



ඉහත පාඨමාලාවලට අදාළ ව සම්පූර්ණ විභාගය, කොටස් විභාග හෝ සෙමෙස්තර (Semesters) විභාග වශයෙන් ඒ ඒ අධ්‍යයන වර්ෂ අනුව විභාග පැවැත්වේ.

මෙම විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීමට අමතර ව, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන බාහිර විභාග හා ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් පවත්වන අභ්‍යන්තර විභාග මෙන් ම සීමාවාසික කාල සීමාවට අයත් ප්‍රායෝගික විෂය ඇගයීම් ලකුණු ඒකාබද්ධ කර අවසාන ප්‍රතිඵල නිකුත් කිරීම ද ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රතිඵල අංශය මඟින් ඉටු කරයි.

විභාග පැවැත්වීමේ දී පවත්වා ගත යුතු ඉහළ ප්‍රමිතිය රඳවා ගැනීමටත්, රහස්‍යභාවය සුරැකීමටත් අදාළ රෙගුලාසි හා ක්‍රමවේද ඇතුළත් විභාග උපදෙස් සංග්‍රහයක් මේ වන විටත් සකස් කර ඇති අතර, ඒ අනුව ඉදිරියේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුව තවදුරටත් ප්‍රතිසංවිධානය වනු ඇත.



# අධ්‍යාපන පර්යේෂණ තේමා පාඨමාලා දෙකක්



පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් වාර්ෂික ව ක්‍රියාත්මක කරන අධ්‍යාපන පර්යේෂණ තේමා පාඨමාලාව යටතේ 'පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය' සහ 'ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය' මැයෙන් වූ තේමා පාඨමාලා දෙකක් 2018 වර්ෂයේ දී සාර්ථක ව නිම කරන ලදි. න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සහිත ව ක්‍රියාත්මක වූ මෙම පාඨමාලා සඳහා, අධ්‍යාපන ක්ෂේත්‍රය හා සම්බන්ධ පර්යේෂණකරණයේ නිරත ව සිටින විද්‍යාර්ථීහු හැට දෙනෙක් සහභාගි වූහ.

පාඨමාලාවලට අවශ්‍ය සම්පත් දායකත්වය, පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යයන කාර්ය මණ්ඩලය ප්‍රමුඛ, ශ්‍රී ලංකා අධ්‍යාපන පිළිබඳ ඇමෙරිකානු ආයතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය වර්ණා ගුණසේකර සහ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සුජීව වාසිෂ්ඨ යන බාහිර විද්වතුන්ගෙන් ලබා ගන්නා ලදී.



## ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර අනුස්මරණ දේශනය 29

# සමානතාවට එරෙහි ව සමතාව

## පළමුවෙනි පිටුවෙන්...

පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් වාර්ෂික ව සංවිධානය කරනු ලබන ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර අනුස්මරණ දේශන මාලාවේ 29 වැනි දේශනය 2018 ඔක්තෝබර් මස 15 වන දින ජාතික අධ්‍යාපන ආයතන නව ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.





ශ්‍රී ලාංකික විද්වතකු විසින් පවත්වනු ලබන මෙම අනුස්මරණ දේශන මාලාවේ මෙවර දේශනය පැවැත්වූයේ ශ්‍රී ලංකාවේ විද්‍යා අධ්‍යාපනය පිළිබඳ ප්‍රථම මහාචාර්යවරිය වූ ආචාර්ය ප්‍රනේත්‍රා කරුණාරත්න විසිනි. "සමානතාවට එරෙහි ව සමතාව" යන මාතෘකාව යටතේ පැවැති මෙම දේශනයේ දී ගැහැනු ළමයින්ගේ අධ්‍යාපනය අවධාරණය කරමින්, අධ්‍යාපනයේ සමතාව හා සමානතාව යන සංකල්ප හා බැඳී ඇති ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් විමර්ශනාත්මක ව විවරණය කරන ලදී. එසේ ම තිරසාර සංවර්ධන ඉලක්කවලට හරය ලෙස පවතින සමතාව ඇති කිරීම වෙනුවෙන්, මෙරට අධ්‍යාපනය ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ ව ද දේශනයේ දී අවධාරණය කෙරිණි.



අධ්‍යාපන දර්ශනපති උපාධි පාඨමාලාව ආරම්භයත් සමඟ ම ක්‍රමයෙන් ඒ සඳහා ඉල්ලුම් කරන අපේක්ෂකයින් සංඛ්‍යාවෙහි ප්‍රමාණාත්මක වර්ධනයක් ඇති විය. ඒ අනුව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ (Sri Lanka Qualification Framework) එකොළොස් වන මට්ටමට අදාළ සුදුසුකම් සපුරාලීමට හැකි වන පරිදි, පාඨමාලා අන්තර්ගතය සංවර්ධනය කරමින් මෙම පාඨමාලාවෙහි ගුණාත්මකභාවය හා ඵලදායීතාව ඉහළ නංවා ඇති අතර, දැනට කණ්ඩායම් තුනක් අධ්‍යාපන දර්ශනපති උපාධි පාඨමාලාවෙහි අධ්‍යයන කාර්යයෙහි නිරත වේ.



අධ්‍යාපන දර්ශනපති පාඨමාලාවේ පළමු කණ්ඩායම (2007) එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල් ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලය සමඟින්

2019 අධ්‍යයන වර්ෂය සඳහා ද අධ්‍යාපන දර්ශනපති පාඨමාලාවට අයදුම්පත් කැඳවීමට ජාතික අධ්‍යාපන ආයතනය පියවර ගෙන ඇති අතර, 2019 සැප්තැම්බර් මස අයදුම්පත් කැඳවීමට අපේක්ෂා කෙරේ. පාඨමාලාව වසර 03ක කාල සීමාවකට යටත්ව වන අතර බඳවා ගැනීමට අදාළ මූලික සුදුසුකම වන්නේ රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ පිළිගත් අධ්‍යාපන ආයතනයක අධ්‍යාපනපති උපාධි පාඨමාලාව සමත් ව තිබීම යි. පාඨමාලාවේ සම්බන්ධීකරණ කටයුතු කරනු ලබනුයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සුධර්මා හරිශ්චන්ද්‍ර විසිනි.

### විද්වතුන් සඳහා විශිෂ්ට පර්යේෂණ කුසලතා සැපයීම

අධ්‍යාපන දර්ශනපති උපාධිපාඨමාලාව මගින් ස්වකීය පර්යේෂණ කුසලතා සංවර්ධනය කර ගැනීමට ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල අධ්‍යාපනඥයින්ට හැකියාව ලැබී ඇත. ඒ අනුව සාර්ථක ව පාඨමාලාව හදාරන ලද පාඨමාලාලාභිනියක වූ ඊ. කේ. එම්. ද සිල්වා මහත්මියගේ පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කිරීමේ සැසියක් 2019. 02. 05 වැනි දින අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ජයන්ති ගුණසේකර සහ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ සභාපති මහාචාර්ය ජයදේව උයන්ගොඩ ගේ ප්‍රධානත්වයෙන් පැවති අතර ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ සෙසු සමාජිකයෝ මෙන් ම ආයතනයේ ශාස්ත්‍රීය කටයුතුවල නියැළෙන සියලු ම නිලධාරීහු ද එම අවස්ථාවට සහභාගී වූහ.

# අධ්‍යාපන පර්යේෂණ සඟරා නිකුත් කෙරේ

දේශීය හා විදේශීය වශයෙන් පර්යේෂණ දැනුම ප්‍රචලිත කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ව, අධ්‍යාපන පර්යේෂණ සඟරා තුනක් පළ කරනු ලබයි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය ආශ්‍රිත පර්යේෂණ ඇතුළත් "ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ සඟරාව" සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කෙරෙන අතර, දකුණු ආසියානු කලාපීය අධ්‍යාපන පද්ධතිය සම්බන්ධ පර්යේෂණ ආශ්‍රිත ව ,සාක් අධ්‍යාපන පර්යේෂණ සඟරාව, පළ කරනු ලබයි.

## ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ සඟරාව

2018 වර්ෂයේ දී ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ සඟරාව (සිංහල මාධ්‍ය) සහ සාක් අධ්‍යාපන පර්යේෂණ සඟරාව (ඉංග්‍රීසි මාධ්‍ය) යන සඟරා දෙක නිකුත් කර ඇත. මෙවර ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ සඟරාවේ අන්තර්ගත වන්නේ, සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය ආශ්‍රිත තක්සේරුකරණය, ප්‍රාථමික ශ්‍රේණි සඳහා විමර්ශන පාදක ලෙස පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් අත්දැකීම් ලබා දීමේ දී පන්තිකාමර කළමනාකරණය, මව් භාෂාව සිංහල වූ ඩිස්ලෙක්සියා සිසුන්, ශබ්ද නගා කියවීම සම්බන්ධයෙන් දක්වන ගැටලු, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පාසල් තොරතුරු තාක්ෂණික මධ්‍යස්ථානයේ භාවිතය යන පර්යේෂණ ලිපි වේ.





## සාක් අධ්‍යාපන පර්යේෂණ සඟරාව




මෙවර සාක් අධ්‍යාපන පර්යේෂණ සඟරාවේ, ශ්‍රී ලංකාව, ඉන්දියාව සහ නේපාලය යන රටවල පර්යේෂකයින්ගේ පර්යේෂණ ලිපි ඇතුළත් ව තිබේ. ඒ අතරින් ශ්‍රී ලාංකික පර්යේෂණ ලිපි වශයෙන්, ශ්‍රී ලංකාවේ ද්විතීයික ශ්‍රේණිවල පෙරදිග සංගීතය ඉගැන්වීමේ දී සම්මිශ්‍රිත ඉගෙනීම, විද්‍යා විෂයය සාධනය සහ පෙලඹවීම, ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීමෙහි නිරත ගුරුවරුන්ගේ ආතති මට්ටම, තක්සේරුකරණය සහ පාසල් පාදක මූල්‍ය කළමනාකරණය යන තේමාවලට අදාළ ලිපි සම්පාදනය වී තිබේ. ඉන්දියාව සහ නේපාලය නියෝජනය කරමින් ඉන්දියාවේ සරණාගත ළමා ගම්මාන පාසල් ආශ්‍රිත අධ්‍යාපනය, නේපාලයේ ඉගැන්වීම සඳහා දේශීය දැනුම පදනම් ව සිදු කාර්ය සාධනය වැඩි දියුණු කිරීම යන තේමා ආශ්‍රිත පර්යේෂණ ලිපි අන්තර්ගත ව තිබේ.

ජාතික අධ්‍යාපන ආයතනයේ නිල වෙබ් අඩවියෙන් www.nie.lk මෙම පර්යේෂණ සඟරා පරිශීලනය කිරීමට අවස්ථාව සලසා ඇත.



# නවතම පුවත්

# Up coming News

## 30 වන ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර අනුස්මරණ දේශනය 2019 ඔක්තෝබර් 14 වන දා

ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර අනුස්මරණ දේශන මාලාවේ 30 වැනි දේශනය 2019 වසරේ ඔක්තෝබර් මස 14 වන දින, ජාතික අධ්‍යාපන ආයතනයේ නව ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර තිබේ. මෙවර දේශනය පවත්වනු ලබන්නේ ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය සභාවේ හිටපු සභාපති සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ගණිතය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කරන ආචාර්ය උපාලි මාම්පිටිය මහතා විසිනි.

## අධ්‍යාපන පර්යේෂණ සඟරා නිකුත් කෙරේ

2019 වර්ෂයේ නිකුත් කෙරෙන පර්යේෂණ සඟරා සඳහා ලිපි සම්පාදනය කිරීමට, අධ්‍යාපන ක්ෂේත්‍රය ආශ්‍රිත ව පර්යේෂණ කාර්යයේ නියැලි පර්යේෂකයනට අවස්ථාව පවතින අතර, එම පර්යේෂණ ලිපි "අධ්‍යක්ෂ, පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම" යන ලිපිනයට යොමු කළ යුතු වේ.

## අධ්‍යාපන පර්යේෂණ ජේමා පාඨමාලා දෙකක්

2019 වර්ෂය සඳහා ද පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් නව ජේමා යටතේ අධ්‍යාපන පර්යේෂණ ජේමා පාඨමාලා දෙකක් පැවැත්වීමට සැලසුම් කරන ලදී. ඉන් පළමු වැන්න "පර්යේෂණ යෝජනාවක් ලිවීම" මැයෙන් ද, දෙවැන්න "පර්යේෂණ ලේඛනකරණය සඳහා වන ශාස්ත්‍රීය ලේඛන ශෛලිය" මැයෙන් ද වන අතර ඒවා නොදින පාඨමාලා ලෙස සැලසුම් කර තිබේ. මෙම පාඨමාලා සඳහා සහභාගි වීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සම්බන්ධ වැඩිදුර තොරතුරු ජාතික අධ්‍යාපන ආයතනයේ නිල වෙබ් අඩවියෙන් www.nie.lk ලබා ගත හැකි ය.

## පර්යේෂණ අනාවරණ ප්‍රචලිත කිරීමේ සම්මන්ත්‍රණය - 2019

ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් වාර්ෂික ව සැලසුම් කරනු ලබන පර්යේෂණ අනාවරණ ප්‍රචලිත කිරීමේ සම්මන්ත්‍රණය 2019 දෙසැම්බර් මස 6 වන දින පැවැත්වීමට සැලසුම් කර තිබේ. අධ්‍යාපන පද්ධතිය සංවර්ධනය කිරීමේ කර්තව්‍යයෙහි ලා පුරෝගාමී ව කටයුතු කරන, අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදක තලයේ සිට ක්‍රියාත්මක තලය දක්වා වූ විවිධ ස්තර නියෝජනය කරන පාර්ශ්ව සහ ආයතනවල අධ්‍යාපන පර්යේෂණයන්හි නිරත වූ පර්යේෂකයන්ට, පර්යේෂණ සහ පර්යේෂණානුබද්ධ ක්‍රියාකාරකම් ආශ්‍රිත අනාවරණ ඉදිරිපත් කිරීම සඳහා සම්මන්ත්‍රණය විවෘත ය.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ජාතික අධ්‍යාපන ආයතනයේ නිල වෙබ් අඩවියෙන් www.nie.lk ලබා ගත හැකි ය.

## NEWSLETTER දායකත්වය

**උපදේශකත්වය**
ආචාර්ය ජයන්ති ගුණසේකර - අධ්‍යක්ෂ ජනරාල්

**අධීක්ෂණය**
ආචාර්ය දයානන්ද කෙප්පෙටිගොඩ - අධ්‍යක්ෂ

**ප්‍රධාන සංස්කාරක**
කේ. ඒ. එස්. සුලෝචනා අලෙක්සැන්ඩර් - කථිකාචාර්ය

**සංස්කාරක මණ්ඩලය**
ඩබ්. කේ. හිරාණි පුෂ්පමාලා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ඩී. හෙට්ටිගේ - කථිකාචාර්ය
එන්. ඩී. දිසානායක - කථිකාචාර්ය
එම්. ඩී. ඩී. අයිරාණි ද සිල්වා - සහකාර අධ්‍යාපනඥ

**බාහිර සම්පත් දායකත්වය**
ජේ. කේ. අශේල සැලුම් - මාධ්‍ය සම්බන්ධීකාරක
එමර් නිරංජලා ගමගේ - මාධ්‍ය සම්බන්ධීකාරක

**ලිපි සැපයුවෝ**
පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව
මාර්ගෝපදේශන හා උපදේශන දෙපාර්තමේන්තුව
විභාග දෙපාර්තමේන්තුව
ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**භාෂා සංස්කරණය**
ආචාර්ය ගොඩ්වින් කොඩිතුවක්කු

**පරිගණක චිත්‍රක නිර්මාණකරණය**
ටී.ඩබ්ලිව්.ඩී.සංජීව

**මුද්‍රණය**
ජාතික අධ්‍යාපන ආයතනය